**මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය සභාව**
**මුලතිව් දිස්ත්‍රික්කය**
**-----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**------------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-----------------------------------**

2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 21 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 20 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2015 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 මැයි 05 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මාන්තෙයි නැගෙනහිර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**--------------------------------------**

**1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති**
**--------------------------**

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ අඩුපාඩු**
**----------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවලින් වර්ෂ තුනකට පමණ පෙර සභාවට පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ අයිතම 149 ක වටිනාකම් තක්සේරු කර අවසන් ගිණුම්වලට ගෙන නොතිබුණි.

(ආ) සභාවේ දැනට ධාවනයේ යොදවා ඇති වාහන 06 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ඇ) සභාව සතු දේපල 09 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ඈ) 2010 සහ 2011 වර්ෂ වෙනුවෙන් ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගෙන් අයකර ගත යුතු එකතුව රු.30,000 ක් වූ මුද්දර බදු ගිණුම්වලට ගෙන නොතිබුණි. එබැවින් සමුච්චිත අරමුදල් ගිණුම එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**
**---------------------------------**

වර්ෂ එකකට (01) වඩා පැරණි අයවිය යුතුව ඇති එකතුව රු.4,878,104 ක් වූ ආදායම් වර්ග 07 ක් අයකර ගැනීම් සඳහා කටයුතු කර නොතිබුණි.

**1.3.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට ආදියට අනුකූල නොවීම**

පහත අවස්ථාවන් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (I) පරිච්ඡේදය III රීති 24 | ප්‍රාදේශීය සභාව ස්ථාපිත කර වසර තුනක් ඇතුලත ප්‍රාදේශීය සභාවට අයත් මහාමාර්ග හා මංමාවත් පිළිබඳ විස්තර ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකල යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (II) පරිච්ඡේදය III රීති 33 | වරිපනම් බදු සම්බන්ධයෙන් සමීක්ෂණයක් පවත්වා නොතිබුණි. |
| (III) පරිච්ඡේදය V රීතිය 140 | එකතුව රු.58,442 ක් වූ නොපියවූ අත්තිකාරම් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (IV) පරිච්ඡේදය IX රීති 180 | මුදල් සහ ගබඩා තොග භාර කටයුතු කරන නිලධාරීන්ගෙන් ආරක්ෂක ඇප ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛය. | සභාව සතු වාහන පිළිබඳව ඉන්ධන පරිභෝජනය පිළිබඳ පරීක්ෂණ පවත්වා නොතිබුණි. |
| (ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශක අත්පොත-2006 | |
| වගන්තිය 5.4.12 | එකතුකළ අගය මත බදු (VAT) සභාව විසින් ගෙවීම් කිරීමෙන් පසු එහි විස්තර එළඹෙන මාසයේ 15 වන දිනට ප්‍රථම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ද එහි පිටපතක් විගණකාධිපතිවරයාට ද යවා නොතිබුණි. |
| (ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| අංක 571 | වර්ෂ 02 සිට වර්ෂ 04 දක්වා වූ කාල පරාසයක් ඇති රු.36,672 වටිනා කල් ඉකුත් වූ තැන්පත් 25 ක් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කර නොතිබුණි. |

**2.	මූල්‍ය විශ්ලේෂණය**

**2.1	මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.11,825,705 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු.3,275,448 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.8,550,257 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සභාවට ලැබුණු පුනරාවර්තන ප්‍රදාන වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන හේතුව වී තිබුණි.

**2.2	විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, පෙර වර්ෂයේ ශුද්ධ අතිරික්තය වූ රු.3,162,948 සමඟ සමාලෝචිත වර්ෂයේ අනුරූප ශුද්ධ අතිරික්තය වන රු.547,824 සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලය රු.2,615,124 ක අඩුවීමක් පෙන්නුම් කෙරේ.

**2.3	මූල්‍ය සමාලෝචනය**

**කාරක ප්‍රාග්ධන කළමනාකරණය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, පෙර වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු.19,301,317 ක මුදල සමඟ සමාලෝචිත වර්ෂයේ සභාවේ කාරක ප්‍රාග්ධනය වූ රු.19,691,486 සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු.390,169 කින් වර්ධනය වී තිබුණි.

**3.	මෙහෙයුම් සමාලෝචනය**

**3.1	කළමනාකරණ අකාර්යක්ෂමතා**

සභාවේ පවතින සේවක සංඛ්‍යා පුරප්පාඩු 15 ක් පිරවීමට අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

**3.2	වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ)	ලෝක ආහාර වැඩසටහන යටතේ 2010 වර්ෂයේදී ලැබී තිබූ උදලු සහ සවල් 36 ක් වර්ෂ 06 ක කාලයක සිට ගබඩාවේ නිෂ්කාර්යව තිබීමට ඉඩ හැර තිබුණි.

(ආ)	මුදල් රෙගුලාසි 757 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා සම්බන්ධයෙන් ගතයුතු ක්‍රියාමාර්ග විගණනය දින දක්වා ලබාදී නොතිබුණි.

**3.3	කොන්ත්‍රාත් පරිපාලනය**

2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛ නියමයන්ට පටහැනිව ප්‍රජාපාදක සංවිධානවලට සෘජුවම කොන්ත්‍රාත් වැඩ පවරා තිබුණි. තවද මෙම ප්‍රජා පාදක සංවිධානවලට මූල්‍යමය හැකියාවක් ද නොතිබුණි. එසේම සභාවේ ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ ලබාගෙන නොතිබුණි. කොන්ත්‍රාත්තුවල ප්‍රගතිය විගණනය විසින් ඉල්ලා තිබුණද ඒවා ඉදිරිපත් කර නොතිබුණි.

**3.4 ප්‍රමාද වූ ව්‍යාපෘති**

එකතුව රු.1,570,000 ක් වන රු.මිලියනය බැගින් වූ ව්‍යාපෘති 09 ක් සමාලෝචිත වර්ෂයේදී වැඩ ආරම්භ කර තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ව්‍යාපෘතිවල වැඩ අවසන් කර නොතිබුණි. තවද මෙම ව්‍යාපෘතිවල වැඩ වටිනාකම රු.1,570,000 වියදම් වශයෙන් පෙන්වා තිබූ අතර විවිධ ණයහිමි ගිණුම බැරකර තිබුණි. කෙසේ වුවද මෙම වැඩ ක්‍රියාත්මක කිරීම සඳහා සභාව විසින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාත් කටයුතු කර නොතිබුණි

**3.5** සන අපද්‍රව්‍ය කළමනාකරණය

සභා බල ප්‍රදේශයෙන් ඉවත් කරන ලද කැලි කසල පිළිස්සීම සහ පස්වලින් යටකිරීම යන ක්‍රියාමාර්ග පමණක් සභාව විසින් අනුගමනය කර තිබුණු අතර කොම්පෝස්ට් සහ ප්‍රතිචක්‍රීයකරණ වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**4.1 අයවැය පාලනය**

ආදායම් ඇස්තමේන්තු අදාල පරිදි සැලසුම් කර සකස් නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ අයවැයගත වියදම් සහ තත්‍ය වියදම් අතර රු.63,369 සිට රු.1,916,711 ක් දක්වා විචලනයන් නිරීක්ෂණය විය.

**4.2 ප්‍රසම්පාදන සැලැස්ම**

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතේ 4.2 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සමාලෝචිත වර්ෂයට අදාල ප්‍රසම්පාදන සැලැස්ම සහ ප්‍රසම්පාදන කාලරාමුව සභාව විසින් සකස් කර නොතිබුණි.

**4.3 අභ්‍යන්තර විගණනය**

සමාලෝචිත වර්ෂයට අදාලව සභාවේ වැඩකටයුතු ඵලදායි ආකාරයෙන් පරීක්ෂා කර බැලීම සඳහා අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාත්මක කර හෝ පිහිටුවීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

4.4 **විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්**

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ 2009 ජුනි 09 දින හා DMA/2009(1) අංක දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ නියමයන් ප්‍රකාරව වර්ෂයකට අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් වත් පැවැත්විය යුතු වුවද එකදු රැස්වීමක්වත් සමාලෝචිත වර්ෂයේදී පවත්වා නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(i) ආදායම් රැස්කිරීම

(ii) ස්ථාවර වත්කම්

(iii) ගිණුම්කරණය

(iv) සේවක සංඛ්‍යාව

(v) වාහන උපයෝජනය

(vi) විවිධ තැන්පත්

(vii) අයවැය පාලනය

(viii) ප්‍රසම්පාදන ක්‍රියාවලිය